| |
|---|
| ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය |
| දෙවන වාර පරීක්ෂණය - 2018 |
| 07 ශ්‍රේණිය     සංගීතය I - II     කාලය පැය |

- **ප්‍රශ්න අංක 1-20 දක්වා ඇති සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. සප්තකයට අයත් ස්වර සංඛ්‍යාව හා සප්තකය තුළ ඇති සියලුම ස්වර සංඛ්‍යාව පිළිවෙලින් ගත් විට දැක්වෙන්නේ,

I. 5 හා 7 ලෙසනි.     II. 7 හා 10 ලෙසිනි.

III. 7 හා 12 ලෙසිනි.     IV. 5 හා 12 ලෙසිනි.

2. සප්තකයේ ඇති අචල ස්වර සංඛ්‍යාව 2කි.එනම්,

I. ස,ප වේ.     II. ග,ප වේ.     III. ම,ප වේ.     IV. රි,ග වේ.

3. සප්තකයක් තුළ ඇති කෝමළ ස්වර සංඛ්‍යාව,

I. 2 කි.     II. 4 කි.     III. 5 කි.     IV. 6 කි.

4. ස්වර පුවරු සංගීත භාණ්ඩයක සරි, සරිග, .............. යන ස්වර වාදනය වීමේදී ඇඟිලි හැසිරවිය යුත්තේ,

I. 1 2 , 3 4 5 ලෙසිනි.     II. 1 2 3 , 1 2 ලෙසිනි.

III. 1 2 , 1 2 3 ලෙසිනි.     IV. 1 2 3 , 2 1 ලෙසිනි.

5. සරිස, සරිගරිස ................................ ඊළඟ ස්වර ඛණ්ඩය වන්නේ,

I. සරිගමගරිස     II. සරිගමපමගරිස

III. සරිසරිගමප     IV. සරිගරිගමගම

6. මාත්‍රා 2 බැගින් බෙදෙන ගී පාදයකි.

I. මිහිකත / නලවා _ / ලා_ _ _

II. එකට / සතුටු / සා _ ග/ රේ _ _

III. කිරි / සුදු/ හා _ / වා _

IV. කඳුපෙළ / අතරේ _ / තුරුවදු / ලේ _ _ _

7. ස්වර ස්ථාපන ගීතයකි,

I. සුවඳ පද්ම ඕලු ආදී

II. සසර වසන තුරු

III. එකට සතුටු සාගරේ

IV. නිල් අහස් තලේ අගේ

8. "තිත්" "තෙයි" යන ධ්වනි නිකුත් වන්නේ,

I. බෙර වාදනයේදී.

II. සර්පිනා වාදනයේදී

III. රබන් වාදනයේදී

IV. තාලම්පට වාදනයේදී

9. අවග්‍රහ ලක්ෂණය දැක්විය හැකි ගී පාදයකි.

I. දුර / පෙනෙන / තැනිත / ලා _ _

II. +රළ ලා _ / උපුලා _ / +ලෙලු මතු / ලා _ යා _

III. හෙළ / ජා _ තික / අභිමා _ / නේ _ _ _

IV. පිනවන / දුටුදන / සෑ _ _ _ / ම _ _ _

10. හාස්‍ය රසය ජනිත කරවන නාට්‍යක එන ගීත විශේෂයකි.

I. කෝලම් ගී II. නූර්ති ගී III. රබන් ගී IV. නව නාට්‍ය ගී

- **A** කොටසේ ඇති කරුණු වලට ගැළපෙන පිළිතුරු **B** කොටසින් තෝරා යා කරන්න.

| **A** | **B** |
|---|---|
| 11. සඳුන් කොකුම් මොර සුගාන | a. දේශාභිමානී ගීතයකි. |
| 12. ගම්භිර කාලිංග නුවර | b. කෝමළ ස්වර ස්ථාපන ගීතයකි. |
| 13. දන්න වංහුං අප කන්න සාමි | c. රබන් ගීතයකි. |
| 14. රත්න දීප ජන්ම භූමි | d. නූර්ති ගීතයකි. |
| 15. පොත පත කියවා නුවණ වඩා | e. කෝළම් ගීතයකි. |

- **පහත දැක්වෙන පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.**

**(මධ්‍ය, විලම්බ, අනාඝාතාත්මක, ආඝානාත්මක, ධ්‍රැත)**

තාලයක් සහිතව ගැයිය හැකි පැදි 16. ....................... පැදි නමින්ද, තාල රහිතව ගැයෙන පැදි 17. ....................... පැදි නමින්ද හඳුන්වයි.

ලය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදෙන අතර එය 18. ....................... ලය 19. ....................... ලය 20. ....................... ලය නමින් හඳුන්වනු ලබයි.

## II කොටස

- **ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

පහත දක්වා ඇති වගුවේ **A** කොටසෙහි සඳහන් විස්තරයට අනුව වඩාත් සුදුසු සංගීත භාණ්ඩය **B** කොටසෙහි සඳහන් කරන්න.

1. I.

| A<br>භාණ්ඩය හැඳින්වීම | B<br>භාණ්ඩය හැඳින්වීම |
|---|---|
| 1. සුළඟේ ආධාරයෙන් හඬ නිපදවන සිදුරු 7කින් සමන්විත වූ සුෂිර භාණ්ඩයකි. | ................................................................ |
| 2. සුළඟේ ආධාරයෙන් හඬ උපදවන බැලෝව සහිත ස්වර පුවරු භාණ්ඩයකි. | ................................................................ |
| 3. පෙරදිග අපරදිග සම්ප්‍රදායන් දෙකෙහිම භාවිත වන තත් හතරකින් සමන්විත භාණ්ඩයකි. | ................................................................ |
| 4. කොටස් දෙකකින් යුතු අවනද්ධ භාණ්ඩ වර්ගයට අයත් උතුරු ඉන්දීය තාල වාද්‍ය භාණ්ඩයකි. | ................................................................ |
| 5. පික් එකක ආධාරයෙන් හඬ නිපදවන තත් 6කින් සමන්විත වූ ලෝකයේ බොහෝ රටවල ප්‍රසිද්ධ අපරදිග සංගීත භාණ්ඩයකි. | ................................................................ |

II. ඉහත 4 වන කොටසෙහි කියැවෙන සංගීත භාණ්ඩයේ දළ රූප සටහනක් අඳින්න.

III. මාත්‍රා තුනෙන් තුනට ගැයෙන ගීතයක එක් පාදයක් ප්‍රස්තාර කර දක්වන්න.

2. I. මධ්‍ය සප්තකය දැක්වෙන ස්වර පුවරුවක රූප සටහනක් අඳින්න.

II. එම ස්වර පුවරුවේ කළු යතුරු වලට අයත් විකෘති ස්වර 5ක් නම් කරන්න.

3. I. ඔබ කැමති එක් ස්වර ස්ථාපන ගීතයක, ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

II. එම ගීතයට වාදනය කළ හැකි හින්දුස්ථානි තාලයක් නම් කරන්න.

III. එම හින්දුස්ථානි තාලයට සමාන වන දේශීය තිත් රූපය නම් කර එයට අදාළව කැමති බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

4. I. මගේ සුරතලා , වැස්ස , මගේ පාසල , මගේ රට ....... මෙම මාතෘකා අතරින් ඔබ කැමති එක් මාතෘකාවක් තෝරාගෙන, පාද හතරකින් සමන්විත කුඩා ගී පද මාලාවක් නිර්මාණය කරන්න.

II. උච්ච සප්තකය, මධ්‍ය සප්තකය, විකෘති ස්වර, අචල ස්වර යන පාරිභාෂික වචන අතරින් 3ක් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.